## රාජ්‍ය , පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
## ස්වදේශ කටයුතු අංශය
## සුභ සාධක ආපන ශාලාව සඳහා මිල ගණන් කැඳවීම.

රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ "නිල මැඳුර",ඇල්විටිගල මාවත, නාරාහේන්පිට,කොළඹ 05 ලිපිනයේ පිහිටි ස්වදේශ කටයුතු අංශයේ සුභ සාධක ආපන ශාලාව සඳහා 2026/2027 වර්ෂයට අදාලව සුදුසුකම්ලත් ආයතන වෙතින් මිල ගණන් කැඳවනු ලැබේ .

මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන ලංසුකරුවන්ට 2026.09.24 දින සිට 2026.10.09 දින දක්වා කාර්යාල දිනයන් හි පෙරවරු 9.00 සිට පස්වරු 3.00 අතර කාලය තුළ රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් නමින් ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ආපසු නොගෙවන රු.5,000.00 ක මුදලක් ස්වදේශ කටයුතු අංශයේ සරප් කවුන්ටරය වෙත ගෙවීමෙන් පසු "නිල මැඳුර" ගොඩනැගිල්ලේ 16 වන මහලේ, ප්‍රසම්පාදන ශාඛාවෙන් අදාළ ලේඛන ලබාගත හැක.එමෙන්ම එම කාලය තුල ස්වදේශ කටයුතු අංශයේ නිල වෙබ් අඩවියෙන් අදාළ ලේඛණ පරීක්ෂා කර බැලිය හැක.

"නිල මැඳුර" ආපන ශාලාව සඳහා අවම තක්සේරු මිල රු.60,000.00 වන අතර ඔබ විසින් ගෙවීමට එකඟවන කුලී මුදල සඳහා ලංසු ඉදිරිපත් කල යුතුය.තක්සේරු මිලට වඩා වැඩි ඉල්ලුම්කරු අනෙකුත් අවශ්‍යතා සපුරා ඇත්නම් ඔහුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබේ.

ලංසුකරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

- ස්වදේශ කටයුතු අංශය විසින් ඉදිරිපත් කර ඇති ආහාර මිල ගණන් යටතේ ආහාර සැපයිය යුතු අතර ඇගයීම සිදු කරනු ලබන්නේ ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මාසික ගොඩනැගිලි කුලී මුදල සඳහාය.
- අවම වශයෙන් වසර 02 ක කාලයක් රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක ආපන ශාලා පවත්වා තිබිය යුතුය. (සේවා පළපුරුද්ද පිළිබඳ සහතික වලින් සනාථ කළ යුතුය.)
- ආහාර සැපයීම, ආපනශාලාව පවත්වාගෙන යාම සම්බන්ධව ව්‍යාපාර පවත්වාගෙන යාම පිළිබඳව නිකුත් කරන ලද ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයේ පිටපතක් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සහතික කරන ලද වෙළඳ බලපත්‍රයෙහි සහතික කරන ලද පිටපතක් ලංසු ලියවිලි සමඟ ඉදිරිපත් කල යුතුය.
- ආහාර පිළියෙල කරන්නන්ගේ නිපුණතාවය පිළිබඳව සහතික හා ආහාර පිළිගැන්වීම කරන්නන්ගේ නිපුණතා පිළිබදව සහතික ඉදිරිපත් කළ යුතුය.

- ආහාර සෞඛ්‍යාරක්ෂිතව සහ ආහාර සුරක්‍ෂණ ක්‍රමවේදයන්ට යටත්ව සැපයීමට ඇති හැකියාව පිළිබඳව සහතිකයක් ඉදිරිපත් කල යුතුය.
- රජයේ ආයතන මගින් අසාධු ලේඛන ගත වූ සැපයුම්කරුවන් සමග ගිවිසුම් ඇති කර ගනු නොලැබන බැවින් ලංසුකරු එසේ අසාධු ලේඛන ගත නොවූවකු බවට ලිඛිත ප්‍රකාශයක් ලබා දිය යුතුය.
- සියලුම ලංසුකරුවන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත ඕනෑම වානිජ බැංකුවකින් **ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - ස්වදේශ කටයුතු අංශය** නමින් ලබාගත් රු.50,000.00 ක වටිනාකමින් යුතු ලංසු සුරක්ෂණ සහතිකයක්/ඇපකරයක් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය. මෙම ලංසු සුරක්ෂණය 2026 නොවැම්බර් 28 දින තෙක් වලංගු විය යුතුය. එසේ නැතහොත් අමාත්‍යාංශයේ ගණකාධිකාරී ගෙවීම් වෙත රු.50,000.00ක මුදලක් ගෙවා ලබා ගත් කුවිතාන්සිය අදාල ලංසු පතට ඇමිණිය යුතුය. මෙම ලංසු ඇපකරය හෝ මුදල් තැන්පතුව සුදුසු ලංසුකරුවෙකු තෝරාගත් විගස වහාම නිදහස් කරනු ලැබේ.

මෙම සුභ සාධක ආපන ශාලාව "නිල මැදුර'' පරිශ්‍රයෙහි 12 වන මහලේ පිහිටා ඇති අතර 2026.09.24 දින සිට 2026.10.09 දින දක්වා කාර්යාලයීය දිනයන්හි දී පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා අතර කාලය තුළ පරික්ෂා කළ හැක.

සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු පත්‍රිකා 2026.10.12 ප.ව 02.00ට පෙර ලැබෙන පරිදි පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් හෝ බාරදිය හැකි අතර ප.ව 02.00 පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප වේ. 2026.10.12 දින ප.ව 02.15 ට 16 වන මහලේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු අතර එදිනට ඔබ හෝ ඔබගේ නියෝජිතයෙකු සහභාගී විය හැකිය.

ලේකම්

රාජ්‍ය පරිපාලන , පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - ස්වදේශ කටයුතු අංශය

නිල මැදුර,

ඇල්විටිගල මාවත ,

නාරාහේන්පිට ,

කොළඹ 05.